# ගී සඳලුව

Gee... Sandaluwa



## සිසිර දිසානායක

කාලයෙන් කාලයට මේ රටට සංක්‍රමණය වෙන අපේ අය අපේ රටින් බොහොම දේවල් අරගෙන එනවා. තමන් උපතින් ලබාපු දක්ෂකම් වගේම ඉගෙන ගන්න දේ ඒ අතරින් ප්‍රධානයි. සමහර විට මේ දේවල් දෙපැත්තක ගියත්, සමහර අය මේවා එකතු කරගෙන වැඩි දියුණු කරගෙන තමන්ගේ අය අතරේ බෙදා හදා ගන්නටත් උනන්දු වෙනවා. මේ අතරින් "ගී සඳළුව" ට අදාල වෙන්නේ සංගීතය ගැනයි. උපතින් ම ගීත ගයන්නට හපන්කම ලැබුණු, වැඩි දුරට ඒ විෂයය ඉගෙන ගත්ත ශිල්පිනියක් මෙල්බන් නුවරදී තමන්ගේ මුල් ම සංගත තැටිය එළිදක්වන්න සූදානම් වෙනවා. "වැස්සක් වාගේ" සංගත තැටිය එළිදක්වන විශාරද චමරී වීරකෝන් මෙල්බන් ගායන වේදිකාවට නම් අමුතුවෙන් හඳුන්වලා දෙන්න ඕන නෑ. ඇත්තට ම ඇය තමන් ඉගෙන ගත්ත ශිල්පය දරුවන්ටත් බෙදා දෙන්නේ වෙනත් අංශයකට යොමු වුණ තමන්ගේ රැකියාවට අමතරව. ඇයගේ "වැස්සක් වාගේ" ගී සමුච්ඡය මෙවර ගී සඳළුවට මාතෘකාව වෙනවා.

චමරී මවක්. "වැස්සක් වාගේ" ගී එකතුවේ තමන් වැඩියෙන් ම කතා කරන්න කැමති ගීතය විදියට ඇය තෝරා ගත්තේ "සැබෑම අම්මා" කියන ගීතයයි. අපි අහමු.

සැබෑම අම්මා ගීතය කරන්න අපිට නිමිත්ත වුණේ අපේම හිතවත් පවුලක අම්මා කෙනෙක් කියපු කතාවක්. මේ අම්මාට දරුවෝ තුන් දෙනෙක් ඉන්නවා. ඒ දුවලා තුන්දෙනාගෙන් පොඩි ම එක්කෙනාට "ඩවුන් සින්ඩ්‍රෝම්" කියන තත්වය තියෙනවා. හැබෑයි අපි හැමදාම දකිනවා ඒ දරුවාට පුදුමාකාර ආදරයකින් මේ අම්මා සලකන්නෙ. සමහරක වෙලාවට අනික් දරුවන්ට වඩා අවධානය, ආදරය මේ ළමයාට තියෙනවා. ඉතින් මම දවසක් අහම්බෙන් වාගේ අහපු ප්‍රශ්ණයකට ඒ අම්මා දුන්න උත්තරය මෙහෙමයි, "දැන් බුද්ධාගමේ අපිට කියලා තියෙනවානේ පුළුවන් තරම් පින් කරගන්න කියලා. ඉතින් මේ දරුවාව මට ලැබිලා තියෙන්නේ වෙනත් තලයක ඉඳන් උසස් මට්ටමේ කුෂල කර්මයක් කරගන්න අවස්ථාවක් ලබල දෙන්න කියලා තමයි මම හැම තිස්සේම හිතන්නෙ. ඉතින් හැම වෙලාවෙම මට පින් කරගන්න අවස්ථාව ලැබෙනවා කියලා තමයි මම මේ දේවල් හරිම සතුටින් කරන්නෙ. "ඉතින් ඒ වගේ තරුණ අම්මා කෙනෙක්ගෙන් ඒ වාගේ කතාවක් අහපුවම මට හිතුණා මේ වගේ අම්මලා තව කොයි තරම් ඉන්නවා ඇති ද කියලා. ඒත් ඉතින් අපට කතාකරන්න ලැබෙන්නෙ නෑනෙ ඒ අය එක්ක.

ඉතින් අපි කතා වුණා මේ වාගේ අම්මලා ගැන ලෝකෙට කියන්නත්, ඒ අයට උපහාරයක් විදියටත් එක්ක සින්දුවක් කළොත් හොඳයි කියලා. මේ සංකල්පය ලියන්න හොඳම එක්කෙනා කවුද කියලා හිතන කොට අපට මතක් වුණේ යමුනා මාලනී පෙරේරා කියන ප්‍රවීණ ගීත රචිකාව. ඇයත් දුවලා ඉන්න අම්මා කෙනෙක්. ඉතින් මම අර කියපු වටාපිටාව කිව්වම යමුනා අක්කා බොහෝම සංවේදී විදියට ලියපු වචන ටික තමයි රෝහණ වීරසිංහ සර්ට තනුව හදන්න දුන්නේ." චමරී නුගේගොඩ "කලා භූමි" කලායතනයේ ශිෂ්‍යාවක් විදියට ආචාර්ය රෝහණ වීරසිංහ, වාගේම ලක්ෂමන් විජේසේකර ප්‍රවීණ සංගීතවේදීන්ගෙන් සංගීතය හදාරලා තියෙනවා.

"ඉතින් වචන ටික දැකලා රෝහණ සර් කියපු දේ තමයි අපි මේ සින්දුවට "දුක" කියන දේ එකතු නොකර ඉඳිමු" කියන එක. මොකද මේ අම්මා ඉන්නේ සතුටින්නේ. ඒ සතුට දැනෙන විදියට තනුවක් සංගීතයත් නිර්මාණය කළා. අපට ඒ පණිවිඩය දෙන්න ඕන කරනා විදිහේ අගේ ඇති තනුවක් වුණා රෝහණ සර්ගේ නිර්මාණය.

"ගීතය අහපු දරුවෝ ඇති අම්මලා වගේම තවම දරුවෝ නැති අය පවා බොහොම ස්තූතිවන්ත වුණා මේ වගේ අම්ම කෙනෙක්ගේ ඇත්ත කතාව එළි දක්වපු එක ගැන."

මේ ගීතය වෙනුවෙන් කළ රූප රචනාවක් දැන් "යූ" නාළිකාවෙන් බලන්න පුළුවන්. අගේ ඇති මේ දර්ශණ පෙළ ගැන චමරී කතා කළේත් හරිම සතුටින්.

"මේතාක් විශේෂ සිද්ධියක්. මේ ගීතය ලංකාවෙන් කරගෙන ඇවිත් මුලින් ම අපි අහන්න දුන්නේ ඒ අම්මාටය තාත්තාටයි. දරුවාගේ තාත්තා වෛද්‍යවරයෙක්. නම තීක්ෂණ දිසානායක. තීක්ෂණ කිව්වා "අපි මේ පණිවිඩය ලෝකෙට දෙන්න ඕන. සමහර විට ගීතයේ වචන ඇහුවට විතරක් කෙනෙකුට මේ පණිවිඩය නොතේරෙන්න පුළුවන්. ඉතින් රූප රචනය වෙනුවෙන් වියදම තීක්ෂණයි, සුමේධායි භාර අරගෙන ඒ දේට අපිව උනන්දු කළා. රූප රචනාව ගැන හිතන කොට මුලටම හිතට ආවෙ රුක්මල් නිරෝෂ් අප අතර කලක් මෙල්බන් නුවර විසූ ප්‍රවීණතම තරුණ රංගනවේදියෙක්. සම්මානනීය සංස්කාරකවරයෙක් වගේම ටෙලි නාට්‍ය අධ්‍යක්ෂකවරයෙක්.

"ඉතින් රූප රචනාවෙදිත් ඇත්තටම රඟපෑමක් නොකර පෙනී හිටින්න පුළුවන් ඒ අම්මටයි දුවයි කියලා අපට තේරුණා. ඒ අයව කැමති කරවා ගන්න, ඒ චුට් දුවට සමීප වෙන්න අපිට තිබුණ අභියෝග මග හරවාගත්තේ රුක්මල් තමයි. ඉතින් ඇත්තටම ඒ රූප මාලාවේ තියෙන්නේ රඟපෑමක් නෙවෙයි. ඒ නිසා ඒක හරි සාර්ථක වුණා කියලා හිතනවා. ඒ වගේම ගොඩක් අය පුදුම වුණා මේ අම්මා, සුමේධා ලෝකයට මේ තමන්ගේ දරුවා ගැන හංගන්නෙ නැතුව කියනවා නේද කියන එක ගැන."

අපි ඊ ළඟට "වැස්සක් වාගේ" ගීත එකතුව ගැන කතා බහට යොමු වුණා.

"මම ලංකාවෙදි ගුවන් විදුලියට, රූපවාහිනියට කියපු අනික් අයගේ ගීත වලට අමතරව මගේ ම ස්වතන්ත්‍ර ගීත හතරක් කළා. මීට අවුරුදු 18 කට විතර කලියෙන්. එයින් දෙකක් නවරත්න ගමගේ මහත්මයාත්, එකක් මහේන්ද්‍ර පැස්කුවෙල් මහත්මයාත්, තවත් එකක් කීර්ති පැස්කුවෙල් මහත්මයාත් සංගීතය කරපු සින්දු. කාලයක් යනකල් මට තිබුණෙ ඔය සින්දු හතර විතරයි. ඉතින් මෙල්බන් වලට ආවට පස්සේ ලංකාවට යන කොට තව තව ගීත එකතු කරගත්තොත් හොඳයි කියලා හිතුණා. මොකද යන හැමතැනකදි ම අහනව සී.ඩී. එකක් කරන්නෙ නැද්ද කියලා. ඉතින් මුලින්ම හිතට ආව දෙයක් තමයි අපි දෙන්නා දරුවෝ දෙන්නෙකුත් එක්ක මේ වාගේ රටකට සංක්‍රමණය වුණාම අපි කොහොමද අපේ දේවල් ඒ දරුවන්ට දෙන්නෙ කියන එක. ඒ ගැන යමුනා මාලනී මහත්මියට කියලා ලියවාගෙන නවරත්න ගමගේ මහත්මයාට කියලා සංගීතවත් කරගෙන ගීයක් ගායනා කළා. මෙහේ කිත්සිරි වීරසිංහ කියලා කෙනෙකුට කියලා ලියවාගන්න සින්දුවක් තිබුණා මගේ පාසැල් ජිවිතයට සමීප එකක්. ඒකත් නවරත්න ගමගේ මහත්මයාට ම සංගීතය කරන්න දුන්නා.

ඉතින් ඔය ගීත ගැන කතාකරන කොට නවරත්න ගමගේ මහත්තයා එයාට අළුත් කෙනෙක් ලියලා එවපු ගීතයක් ගැන කිව්වා. ඒ තමයි "වැස්සක් වාගේ" ගීතය. ඒ අශිකා ශ්‍යාමලී නෙළුන්දෙණිය ලියපු සින්දුවක්. ඉතින් අර කලින් කරපු සින්දු වලට රූප රචනා කරගන්න ගියාම සඳරුවන් ජයවික්‍රම අධ්‍යක්ෂකවරයා කිව්වා "වැස්සක් වාගේ" සින්දුව වැඩියෙන් රූප රචනයකට උචිතයි කියලා. ඉතින් ඒකට ආශා එදිරිසිංහ වගේ නිළියන් සම්බන්ධවුණ නිසා ඒ රූප රචනය තවත් ලස්සන වුණා. ඒක ලංකාවේ ස්වාධීන රූපවාහිනියේ "හීන හතක්" ගීත දර්ශකයේ මුල් තැනටත් ආවා.

"ඉතින් ඔය විදියට ඔක්කොම ගීත 14 ක් විවිධ තේමාවල් යටතේ එකතු වෙලා තියෙනවා මේ "වැස්සක් වාගේ ගීත එකතුවට. අර කියපු අයට අමතරව ජගත් ගාමිණී මාවතගම, ජනක සිරිවර්ධන, නාලක සේනසිංහ, බුද්ධදාස ගලප්පත්ති, සිසිර දිසානායක, කිත්සිරි වීරසිංහ, යසනාත් ධම්මික බණ්ඩාර, කෞෂික් මිලින්ද, බන්ධුල නානායක්කාරවසම් ගීත ලියලා තියෙනවා. ඒ වගේම අර කියපු අයට අමතරව, ලක්ෂමන් විජේසේකර, කසුන් කල්හාර, ඉන්ද්‍රජිත් මිරිහාන, නිසල් ගන්ගොඩගේ වගේ අය සංගීත නිර්මාණ වලින් දායක වුණා.




අන්තිමට අප මේ සංගත තැටියේ එළි දැක්වීම ගැන කතා කළා.

"වැස්සක් වාගේ" ගී පොද වැස්ස, සංගත තැටිය දොරට වැඩුමත් එක්ක පැවැත්වෙන්නේ සැප්තැම්බර් 6 වෙනි සෙනසුරාදා හැම්ඩන් පාර්ක් වල "රිවර්ගම්" පර්ෆෝමින් ආර්ට් සෙන්ටර් එකේදියි. ලංකාවෙ දි මට ඇති තරම් මා සේවය කරපු හැටන් නැෂනල් බැංකුවේ කලා කටයුතු වල නිරත වෙන්න ලැබුණා. ඒත් මෙහෙදි හැමෝම අහන නිසාත් මගේ මහත්තයා, අජන්තගේ උනන්දුවත් නිසා මම මේ දේට යොමුවුණා. මේකට මම මගේ ම දරුවනුත් මගෙන් සංගීතය හදාරන සිසු සිසුවියනුත් එක් කරගන්නවා. සංගීත අධ්‍යක්ෂණයෙන් මුල් වරට අසංක ලියනගේ සංගීත වාදන ශිල්පියා, ඉන්ද්‍රජිත් මිරිහානගේ, වගේ ප්‍රවීණයන් වාදනයෙන් දායක වෙනවා.

"මේ වාගේ ප්‍රසංගයක් තනියෙන් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි.

මේ ගමනේදී මට මුලින් ම අත දුන්නේ මගේ අම්මා. ඇය මාව විශාරද නන්දා මාලනී ගුරුවරිය වෙත යොමු කළා. වැඩිදුර සංගීතය හැදෑරුවේ සංගීත් නිපුන් මංජුලා විතානගේ මහත්මියගෙන්. ඇය සංගීතය විතරක් නෙවෙයි සමාජය ගැනත් කියලා දුන්නා. ඒ වගේම පාසැලේ ගුරුවරුන්, තූර්ය වාදක කණ්ඩායම පුහුණු කළ අනිල් මිහිරිපැන්න වගේ ගුරුවරුන් හැම දෙනාවම මේ වෙලාවේ මතක් කරනවා. ඒ අයට පින් දෙනවා. ඒ වගේම මට අත දුන්න ධර්මසිරි ගමගේ මහත්මාවත් මතක් කරන්න කැමතියි. ඔස්ටින් මුණසිංහ මහත්මයාත් ඒ වගේ ගුරුවරයෙක්. ඒ අය හැමෝවම මතක් කරනවා පින් දෙනවා. ඒ වගේම මේ වැඩට මට අත දුන්න මගේ මහත්මයාත්, නවරත්න ගමගේ මහත්මයාත්, මහේන්ද්‍ර පැස්කුවෙල් මහත්මයාත් ආදරයෙන් මතක් කරනවා.

"මේ වාගේ ප්‍රසංගයක් තනියෙන් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. මේ දේට ආශිර්වාදය, උදව් උපකාර දෙන හැමෝටම ස්තූතිවන්ත වෙනවා. ඒ අතර මාධ්‍යවලින් ලැබෙන සහයෝගයත් මතක් කරන්න ඕන. මේ දේවල් අපට ලොකු ධෛර්යයක්, ශක්තියක්, ඒවා ඔක්කොම හදවතේ තියෙනවා.

"මගේ පුංචි හැකියාවක් හරි තියෙනවානම් ඒක එළිදක්වන්නෙ බොහොම ගෞරවයෙන්, ආදරයෙන්. හැමෝටම එකතු වෙලා රස විඳින්න, උණුසුම් ප්‍රතිචාරයක් දක්වන්න මේක හොඳ අවස්ථාවක් වේවි. ඒ එකතුවීම ලොකු හයියක්. මගේ දරුවොයි සිසු දරුවොයි එකතු වෙලා හොඳ දෙයක් කරන්නයි උත්සාහ කරන්නෙ. ඉතින් පුළුවන්කමක් තියෙනවානම් එදාට එනවනම් අපි ගොඩක් සන්තෝෂ වෙනවා. "චමරි තමන්ගේ රසික හිතවතුන්ට, නැයින්ට, අසල්වාසීන්ට ආරාධනා කළේ එහෙමයි.

"අපි ඇයට සුබ පැතුවා."


Victoria Mercantile LAWYERS

**Commercial Litigation**
- Motor vehicle litigation (Motor vehicle accident Claims)
- Debt Recovery
- Contract Disputes

**Business & Commercial Law**
- Sale & Purchase of Business
- Partnership Agreements
- Employment Agreements
- Commercial Leases

**Wills**

**Powers of Attorney**

**Conveyancing**
- Sale & Purchases
- Contract of Sales
- Auction Contracts
- Vendor Statements
- Subdivisions

**Family Law**
- Divorce
- Property Settlements
- Pre-Nuptial Agreements
- Binding Financial Agreements
- Consent Orders

☎(03) 9803 6225 (03) 9803 6226
info@vicmercantilelawyers.com.au
PO Box 5358 Pinewood VIC 3149
www.vicmercantilelawyers.com.au

Anne Heenatimulla LLM (Monash)
Principal
Barrister & Solicitor


රටවල් 40ක සිට ශ්‍රී ලාංකිකයන් අසන ගුවන්විදුලිය - තිසර www.thisara.com